# තොරණ සිතුවමින් සිත් නිවාලන මංගලා

ලොව වඩාත් ම නිහඬ කලාව චිත්‍ර කලාවයි. සිතුවම් නිරන්තරයෙන් ම නිහඬය. සිතුවම් මවන සිත්තරුන් ද නිහඬය. එහෙත් සිත්තරු නිහඬව සිය නිහඬ සිතුවම් තුලින් අන් සියල්ලට ම වඩා ගැඹුරු බවක් අර්ථවත් බවක් ලොවට කියා පාති. ඒ නිසාම ඔවුනගේ ඒ ගැඹුරු අර්ථවත් නිහඬ බව අපගේ ගෞරවාදරයට පාත්‍ර වෙයි.

පුරා වසර නවයක් තිස්සේ සිය තෙළි තුඩින් අර්ථවත් මෙන්ම බොදු සිතුවම් එළි දක්වමින් අපගේ සම්භවය ඇති පුජාවට නිහඬ මෙහෙයක් කරමින් සිටිනා සිත්තරාවියක පිළිබඳවයි මේ සටහන. වසර 2006 දී පමණ එළි දැක්වුණ "සදහම් හිරු කිරණ" මාසිකයට සිය හැකියාවන් මුහු කරනා කාලයේ දී අප දැන හඳුනාගත් ඇය පිළිබඳව යමක් කතා කිරීමට පමා වුණා වැඩි සේයි විටෙක සිතෙයි. වසර 2006 දී පටන් වෙසක් තොරණ සැළසුම් කරමින් චිත්‍ර නිර්මාණය කළ මේ සිත්තරාවිය මේ වන විට තොරණ අටක් අප වෙත ඉදිරිපත් කර ඇති අතර, මේ වන විට සිය නව වැනි තොරණේ සිතුවම් නිමවමින් සිටින්නීය. ඇය මංගලා කළන්සූරිය චිත්‍ර ශිල්පිණියයි.

"ඇත්තටම මම පාසැලේ දී චිත්‍ර විෂයයක් විදියට ඉගෙන ගත්තා.හැරෙන්න වෙනම විශේෂයෙන් අඳින්න ඉගෙන ගෙන නෑ." මංගලා "සන්නස" වෙනුවෙන් සිය හඬ අවදි කළාය.



සිසිර දිසානායක

"පාසැල් කාලයෙන් පස්සෙ මම ඒ තරම් ඇන්දේ නෑ. ඊත් මම මෙහෙ ආවට පස්සෙ ආරංචි වුණා බෞද්ධ පත්තරයකට චිත්‍ර අඳින්න කෙනෙක්ව හොයනවා කියලා. මම කොහොමත් ආසයි බුදු හාමුදුරුවන්ගේ පින්තූර අඳින්න. ඒ දවස් වල මම නිකං ගෙදර සිටිය හින්දා ඇඳපු පින්තූර ටිකකුත් අරගෙන ගිහින් ආචාර්ය සුනන්දා තිලකරත්න මහත්මිය මුණ ගැහුණා. ඉතින් සුනන්දා කිව්වා ගෙවන්න නම් විදියක් නෑ, කැමතිනම් අඳින්න කියලා. මටත් මුදල් උපයන්න ඕන කමක් තිබුණෙ නෑ. මම ආසයි ලංකාවේ දේවල් වලට සම්බන්ධ වෙන්න. ඉතින් මම දිගටම "හිරු කිරණ" පත්‍රයට ඇන්දා."

මංගලාගේ ඇඳීමේ කලාව අප හඳුනා ගත්තේ එකල පළ වූ එම දහම් මාසිකයෙනි. ඇයගේ සුනම්‍ය වූ කෝමළ රේඛාවන්ගෙන් නිර්මාණය වූ බුදු හිමියන්ගේ සිතුවම් මෙන්ම බුදු චරිතයට, ජාතක කථාවලට අදාල සිතුවම් වල වෙනම ම අනන්‍යතාවක් කැටි වී තිබිණ.

"ඉතින් ඒ චිත්‍ර දැකපු කීස්බරෝ වල ධම්මසරණ විහාරයේ වැඩ වසන ගරු නා ඔටුන්නේ විජිත ස්වාමීන් වහන්සේ කිව්වා මම අගේට බුද්ධ පින්තූර අඳිනවා කියලා. ඒ වගේම ආරාධනයකුත් කළා කවදා හරි පන්සලේ තොරණක් කළොත් බුදු හාමුදුරුවන්ගේ සිතුවම ඇඳලා දෙන්න කියලා. ඉතින් ඒ වගේම 2006 විහරස්ථානයේ කරපු තොරණ අඳින්න මට අවස්ථාව ලැබුණා. ඉතින් එදා ඉඳන් මම මේ වෙනකල් හැම අවුරුද්දෙම වෙසක් එකට තොරණ අඳිනවා. 2010 අවුරුද්දේ යුරෝක් පන්සලට කූට විමංසන ජාතකයෙන් ඇඳපු තොරණ ඇරෙන්න අනික් හැම අවුරුද්දකම කළේ කීස්බරෝ පන්සලට."

"ඒ ඇඳපු අනික් ජාතක කතා තමයි "සීල විමංසන", "චුල්ල ධම්මපාලා", "සෙයිය", "සුජාත", "සිඟාල", "ජලන පාද" කියන ජාතක. එක වතාවක් "නන්ද කුමරු මහණ කිරීම" ගැන තොරණක් ඇන්ද. මේ අවුරුද්දේ අඳින්නේ " පඨාචාරා"කතාව."

ඉස්කෝලේ තිබුණ ප්‍රදර්ශන වලට එහෙම චිත්‍ර ඉදිරිපත් කළා ඇරෙන්න වෙනත් විශේෂ දෙයක් කියන්න නෑ. ඊත් මම මෙහේ ඇවිත් අඳින්න පටන් ගත්තයින් පස්සේ අ රමට උපතින් තිබුණ හැකියාව වැඩි දියුණු වුණා කියන්න පුළුවන්. ඊත් මගේ පවුලේ වෙන කිසිම කෙනෙකුට මේ හැකියාව පිහිටලා නෑ "මංගලා බම්බලපිටියේ මිලාගිරියේ ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලයේ ආදී සිසුවියකි. ඇයගේ වර්ණ මාධ්‍ය පිළිබඳව අපි විමසිමත් වූයෙමු.

"තොරණ අඳින කොටනම් මම "ඇක්‍රලික්" සායම් තමයි පාවිච්චි කරන්නේ. ඊට උඩින් ඒ වර්ණ " සීල්" වෙන්න (ආරක්ෂා වෙන්න) පාට වර්ගයක් තවරනවා. සාමාන්‍යයෙන් දිය සායම් වලින් තමයි ඇන්දේ. පාසලේ දී නම් පාට කූරු "පැස්ටල්" තමයි පාවිච්චි කළේ. පත්තර වලට අඳින කොට තෙල් සායම්, (ඔයිල් පේන්ට්) චිත්‍රවලට යොදා ගන්නවා. හුඟක් වෙලාවට මම පැන්සල විතරක් පාවිච්චි කරලා තමයි මම කැමති අනික් චිත්‍ර ඇන්දේ."



"මේ රටට ආවට පස්සේ මම චිත්‍ර පන්තියකට ගියා. මුල් දවසේ අපිට අඳින්න දුන්නේ කොටියෙක්ගේ පින්තූරයක් බලාගෙන අඳින්නග ඔම ඉක්මනින්ම ඇඳලා ඉවර කරපු නිසා ඒ ගුරුතුමිය කිව්වා ඔයා මේ පන්තියට එන්න අවශ්‍ය නෑ, මොකද ඔයාට මේ පන්තියේ උගන්වන මට්ටමට ඉහළ හැකියාවක් තියෙනවා කියලා. ඉතින් මම ඊට පස්සේ පන්ති වලට ගියේ නෑ."

පැන්සල පමණක් යොදා ඇඳි සිතුවම් අතරින් මංගලාගේ ආලේඛ්‍ය චිත්‍ර (පෝට්‍රේට්) වඩාත් කැපී පෙනිණ.

ඊකත් ඉතින් මම ම උරගාලා බැළුව ාමට ඒ හැකියාවත් තියෙනවාද කියලා. මුලින් ම මම ම කණ්ණාඩියෙන් බලාගෙන මගේ රූපය ඇන්දා. මට හිතෙන හැටියට සීයට හැත්තෑවක් අසූවක් විතර සාර්ථක වුණා. ඉතින් මම පැන්සලෙන් ඇන්දා. හැබැයි මම වර්ණයෙන් පෝර්ට්‍රේට් ඇඳලා නම් නෑ." මංගලාගේත් ඇයගේ සැමියා සීවලීගේත් මංගල ඡායාරූපය ඇඳි විශාල ප්‍රමාණයේ ආලේඛ්‍ය චිත්‍රය නිවසේ විසිත්ත කාමරය සරසයි. ඇය ඒ සඳහා "එච්.බී,"ටු එච් වැනි පැන්සල් යොදාගන්නීය. "ඡායාරූපයකින් පෝර්ට්‍රේට්ස් කරන කොට කොටු ඇඳලා පරිමාණයට අඳින එක මම මුලදී කලා. ඊත් ඒ කොටු ගැන ගැන කරන එක ටිකක් කරදරයි. මුලද් කේටු ඇඳලා කරලා පුරුදු වුණාට පස්සේ නිකම්ම අඳින්න පුළුවන්".

"එක ප්‍රදර්ශනයකට තියපු චිත්‍රයක් විකිණුනා. ඊත් ඊට පස්සේ මම ප්‍රදර්ශන වලට විකුණන්න බලාගෙන චිත්‍ර තිබ්බෙ නෑ. මේ හැම දෙයක් ම කරන්නේ නොමිළයේ. යාළුවෝ ඉල්ලන දේවල් කරලා දෙනවා. තොරණ අඳින කොටත් ඒ පුවරු මට පන්සලෙන් අරගෙන දුන්නත් සායම් වර්ග ඔක්කොම ගන්නෙ මගේ වියදමෙන්. අනික තොරණ සැළසුම් කරගන්නෙත් මට මට ඕන විදියටයි. එක තොරණක් මුතු කුඩයක් විදියට සැළසුම් කළා.




සහන්රෝ
ආයුර්වේද හා ජ්‍යෝතිෂ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානය

ඔබගේ සියලුම රෝග නිට්ටාවට සුව කරගැනීමට ප්‍රත්‍යක්ෂ ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර හා පංචකර්ම ප්‍රතිකාර

ඔබේ අනාගතය ශුභ අශුභ විස්තරාත්මකව දැනගැනීමට ජන්ම පත්‍රය පරීක්ෂා කර බලාගන්න

කේන්ද්‍ර සෑදීම
පලාපල විස්තර
පොරොන්දම් සෑදීම
නම් තැබීම
මංගල නැකත් සෑදීම
නිවාස සහ වෙළඳසල් නැකත් සෑදීම
නිවාස වෙළඳසල් ආරක්ෂාව
අපල සඳහා මුදු වර්ග
අපල සඳහා මැණික් වර්ග
අපල සඳහා යන්ත්‍ර
ආරක්ෂක තෙල් වර්ග
ග්‍රහ පූජා



Sannasa Ads

ආයුර්වේද වෛද්‍ය
Dr Sam Dassaíyaka
B.S. (Biology) USA
GDIP AYURVADIC THERAPY (KERALA)
No 392 BLACKBURN ROAD
EAST BURWOOD VIC
Mobile : 0421 793 844
Phone : (03) 9886 6460
EMail : sam@sahanro.com.au

ආයුර්වේද වෛද්‍ය හා ජ්‍යෝතිෂ්‍ය විශාරද
Dr Stanley Dharmakumara
BAMS (Sri Lanka) A. AA AFA (AUSTRALIA)
No 2B LEONARD AV
NOBLE PARK VIC 3174
Moblie : 0435 006 912
0403 730 098
Email : siddarthaoz@hotmail.com


## සමාජවාදයේ බාප්පා




"මෙහාට සැපත්වෙයං වාතදේව''
''පස්වාන් දහසකට බුදුවෙන්ඩ අවසරයි මහා රජාණෙනි, මේං ආවා''
''වැඩකරන ජනතාවගේ ඉල්ලීම් ලබා නොදුන්නොත් සමස්ථ මහා වැඩ වර්ජණයකට යනවා කියලා පොර ටෝක් එකක් දාලා තිබුණ නේද බොල?''
''එසේය මහා රජාණෙනි''
''මගෙන් කකා මටම කෙලින්ඩද උඹෙත් ලෑස්තිය?''
''හාපෝයි නැහැ මහා රාජයාණෙනි, මේකත් අරක වගේම ඔබවහන්සේගේ දෑත් ශක්තිමත් කරන වැඩ පිළිවෙළක්?''
''හෑහ්, ඒ කිව්වේ?''
''ඒ කිව්වේ මහා රජාණෙනි දෝෂාභියෝගෙදි මගේ කොමඩියේ අලුත්ම වර්ෂන් එක''
''තේරෙන භාෂාවෙන් කියපං වාතදේව, නන්නත්තාර වෙන්නේ නැතුව.''
''වැඩකරන ජනතාවගේ ඉල්ලීම් නොදෙන ආණ්ඩුව ගෙදර යවමු කියලා වැඩේ පටන් ගන්නවා."
"ඉතිං"
"එතකොට ආණ්ඩුව ගෙදර යවන්න බලාගෙන ඉන්න වැඩකරන ජනතාව මගේ වටේ එක්වෙනවා. රොක් වෙනවා. විපක්ෂයට බඩු නැතිවෙනවා."
"ඉතිං"
"මහා රාජවරණය ලංවෙනකම් මේ විදිහට කෙකර ගගා ආණ්ඩු විරෝධීන් අවුස්සනවා. අපි වටේම පෙළගස්සනවා."
"ඉතිං"
"මහාරාජවරණයට දවසකට දෙකකට කලින් කියනවා ආණ්ඩුව වැරදි වැඩ කළත් ජාත්‍යන්තර කුමන්ත්‍රණ පරාජය කරන්න අපි අලුත් ආණ්ඩුවක් හැදිය යුතුයි. මේ ආණ්ඩුවේ ඉන්න දූෂිතයන් එළවල අලුත් ආණ්ඩුවක් හදන්න මහා රජාණන්ගේ දෑත් ශක්තිමත් කරන්න මේ පාරත් එතුමටම මනාපෙ දෙමුයි කියලා''
''එතකොට මුං ආයෙත් මටම දෙයිද බං?''
''තිස් අවුරුද්දක් ජයගන්න බැරිවුණ යුද්දෙ දින්න ඔබතුමාට ඇර වෙන කාටද ඒක කරන්ඩ පුළුවන් කියලා ඇහුව ගමන් බඩු ෂුවර් මහා රාජයාණෙනි''
''අම්මපා වාතදේව බලාගෙන ගියාම උඹත් නියම දේශපාලනඥයෙක්නේ, "නූතන සමාජවාදයේ බාප්පා" වගේ සම්මානයකුත් දෙන්න වටිනවා. අම්මපා ඔව්. හොඃ හොඃ හොඃ''

**ම.රා. සාද්**